[1980 ඔක්තෝබර් මස 03 වැනි දින අංක 109 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙන් උපුටා ගන්නා ලදී]

## ධීවර ආඥාපනත

(212 වන අධිකාරය වූ) ධීවර ආඥාපනතේ 33 වන වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල අනුව ධීවර අමාත්‍යවරයා විසින් සාදනු ලැබ ශ්‍රී ලංකාවේ ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද නියෝග.

ෆෙස්ටස් පෙරේරා
ධීවර අමාත්‍ය.

1980.05.23 දින,
කොළඹ දීය.

### නියෝග

1. මෙම නියෝග 1980 ධීවර බෝට්ටු ලියාපදිංචි කිරීම පිළිබඳ නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. ධීවර අධ්‍යක්ෂවරයා විසින් හෝ ධීවර බෝට්ටු ලියාපදිංචි කිරීම සඳහා ඔහු විසින් බලය පවරන ලද යම් නිලධරයකු විසින් හෝ මෙම නියෝග යටතේ නිකුත් කරන ලද ධීවර බෝට්ටු ලියාපදිංචි කිරීමේ සහතිකයක් ඇතිව මිස කිසිදු තැනැත්තකු විසින් ශ්‍රී ලංකා ජල තීරයෙහි මසුන් ඇල්ලීමේ කාර්යය සඳහා යම් ධීවර බෝට්ටුවක් පාවිච්චි කිරීම හෝ ක්‍රියාත්මක කිරීම නොකළ යුතු ය.

3. (1) යම් බෝට්ටුවක් ධීවර බෝට්ටුවක් වශයෙන් ලියාපදිංචි කර කර එවැනි බෝට්ටුවක් සම්බන්ධයෙන් ලියාපදිංචි කිරීමේ සහතිකයක් ලබා ගැනීමට අදහස්කරන සෑම තැනැත්තකු විසින්ම ධීවර අධ්‍යක්ෂවරයා හෝ එවැනි සහතිකයක් නිකුත් කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයක් භාර ගැනීම සඳහා ඔහු විසින් බලය පවරන ලද වෙනත් යම් නිලදරයකු හෝ වෙන මෙහි පළමුවන උපලේඛනයෙ සඳහන් කොට ඇති ''ධීවර 49'' ආකෘතිය මගින් ඒ සඳහා ඉල්ලුම් පත්‍රයක් යැවිය යුතුය.

(2) (1) ඡේදය යටතේ වූ සෑම ඉල්ලුම් පත්‍රයක්ම—

(අ) ඉල්ලුම් පත්‍රයේ සඳහන් කර ඇති බෝට්ටුව සම්බන්ධයෙන් ධීවර අධ්‍යක්ෂවරයා හෝ ඔහු විසින් ඒ සඳහා බලය පවරන ලද යම් නිලධරයකු විසින් නිකුත් කරන ලද මුහුදු ගමන් යෝග්‍යතා සහතිකයක් ; ඉදිරිපත් කොට ලබාගත් බෝට්ටුව සම්බන්ධව වලංගු රක්ෂණ සහතිකය සමඟ ඉදිරිපත් කළ යුතුය.

(ආ) යාන්ත්‍රික නොවන බෝට්ටුවක් සම්බන්ධයෙන් වූ කල්හි රක්ෂණ සහතිකය අනිවාර්ය නොවේ.

එසේ වුවද, මේ ඡේදයේ සඳහන් එම සහතිකය මුහුදු නොයන බෝට්ටු සම්බන්ධයෙන් අවශ්‍ය නොවන්නේ ය.

4. (1) ලියාපදිංචි කිරීමේ සහතිකයක් සඳහා ඉල්ලුම් පත්‍රයක් ලැබුණු විට, ධීවර අධ්‍යක්ෂවරයා හෝ ඔහු විසින් බලය පවරන ලද යම් නිලධරයකු විසින් ධීවර බෝට්ටුව සම්බන්ධයෙන් අවශ්‍යයයි කල්පනා කරනු ලබන පරීක්ෂණයක් පැවැත්වීමෙන් පසුව සහ මෙහි දෙවන උපලේඛනයේ (අ) ලැයිස්තුවේ දක්වා ඇති අදාල ගාස්තු ගෙවූ විට මෙහි පළමුවන උපලේඛනයේ සඳහන් කොට ඇති 'පොදු 172' ආකෘතිය මගින් කුවිතාන්සියක් ඉල්ලුම්කරු වෙත නිකුත් කළ යුතුය. කුවිතාන්සිය නිකුත් කරනු ලබන අවස්ථාවේදී රක්ෂණ සහතිකය ඉල්ලුම්කරු වෙත ආපසු යැවිය යුතුය.

(2) යම් බෝට්ටුවක් සම්බන්ධයෙන් (1) වන ඡේදය යටතේ නිකුත් කරන ලද කුවිතාන්සියක්, ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කරන තුරු, එවැනි බෝට්ටුවකට අදාළ යම් කාරණයකදී තාවකාලික බලපත්‍රයක් වශයෙන් පිළිගත යුතුය.

5. 3 වන නියෝගය යටතේ ඉල්ලුම් පත්‍රයක් ලැබුණ විට, ධීවර අධ්‍යක්ෂ වරයා විසින් එවැනි බෝට්ටුවක් ලියා පදිංචි කිරීමෙන් පසුව, මෙහි පළමුවන උපලේඛනයේ සඳහන් කොට ඇති 'සී.ආර්. ආකෘතිය' මගින් ඒ බෝට්ටුව සම්බන්ධයෙන් ලියාපදිංචි කිරීමේ සහතිකයක් ඉල්ලුම්කරු වෙත නිකුත් කරනු ලැබිය යුතුය.

6. (1) ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කිරීමෙන් පසුව බෝට්ටු වකට පවරනු ලබන ලියාපදිංචි කිරීමේ අංකයන් අනුක්‍රමිකාංක '1යි' වශයෙන් පටන් ගෙන '2යි' '3යි' යනාදී වශයෙන් ලියා ගෙන යා යුතුය. සෑම අනු ක්‍රමිකාංක පෙළකටම 1 සිට 9999 දක්වා අංකයන් තිබිය යුතුය.

ඒ 51526—1,000 (80/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

(2) ධීවර බෝට්ටුවක් වශයෙන් ලියාපදිංචි කරන ලද බෝට්ටුවකට ලියාපදිංචි කිරීමේ අංකය වෙන් කළ විට, බෝට්ටුව අයත් ප්‍රදේශය හැඳින්-වෙන පහත දක්වෙන සංකේත අකුරුද ලියාපදිංචි කළ අංකයේ අගට එකතු කළ යුතුය :—

| ප්‍රදේශය | | සංකේත අකුර |
|---|---|---|
| මීගමුව | ... ... | මී |
| කොළඹ | ... ... | කො |
| කළුතර | ... ... | ක |
| ගාල්ල | ... ... | ගා |
| මාතර | ... ... | මා |
| කංගල්ල | ... ... | ත |
| මඩකලපුව | ... ... | ම |
| ත්‍රිකුණාමලය | ... ... | ත්‍රි |
| මුලතිව් | ... ... | මු |
| කල්මුනේ | ... ... | කල් |
| යාපනය | ... ... | යා |
| මන්නාරම | ... ... | මන් |
| පුත්තලම | ... ... | පු |
| හලාවත | ... ... | හ |

7. (1) 6 වන නියෝගය යටතේ නිකුත් කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකය ලැබුණු විට ඒ සහතිකය දරන්නා විසින් සහතිකයේ දක්වෙන ලියාපදිංචි කිරීමේ අංකය පින්තාරු කරන ලද නාමපුවරුවක් තම බෝට්ටුවට සවිකල යුතුය.

(2) යාන්ත්‍රික බෝට්ටුවක නම් පිට පෝරුවට අඟල් හයක් පහළින් හා ඇණියේ ඉදිරිපස කෙළවරේ සිට අඩියක දුර ප්‍රමාණයකින් එහි පිටත දෙපැත්තේමද, පිට පෝරුවක් සහිත යාන්ත්‍රික නොවන බෝට්ටුවක නම්, එහි පිට පෝරුවට අඟල් හයක් පහළින් හා ඇණියේ ඉදිරිපස කෙළවරේ සිට අඩියක දුර ප්‍රමාණයකින් එහි පිටත දෙපැත්තේමද පිට පෝරුවක් සහිත යාන්ත්‍රික නොවන බෝට්ටුවක නම් එහි ඇණියේ ඉදිරිපස කෙළවරේ සිට අඩියක දුර ප්‍රමාණයකින් එහි පිටත දෙපැත්තේමද කහ පැහැති පසු බිමක අඟල් හයක් උස ඉලක්කම් හා අකුරු කළු පැහැයෙන් පින්තාරු කරන ලද නාම පුවරුවක් සවි කළ යුතුය.

(3) රුවලක් සහිත ධීවර බෝට්ටුවක නම්, අඟල් හයක් උස අකුරු හා ඉලක්කම් වලින් යුක්තව ලියාපදිංචි කිරීමේ අංකය එම රුවලේ දෙපැත්තෙහි කළු පැහැයෙන් පින්තාරු කළ යුතුය.

8. මෙම නියෝග යටතේ නිකුත් කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකයක් ලිත් වර්ෂයක් සඳහා වලංගු වන අතර කවරම හෝ ලිත් වර්ෂයක් සම්බන්ධ යෙන් හෝ එය අලුත් කරනු ලැබිය හැකිය. අදළ වර්ෂයේ ජනවාරි මස 15 වන දිනට පෙර මෙම අලුත් කිරීම කළ යුතුය. වලංගු රක්ෂණ සහතිකයක් ද, පවත්නා ලියාපදිංචි කිරීමේ සහතිකය සහ මුහුදු ගමන් යෝග්‍යතා සහතික යද, ප්‍රදේශයේ ධීවර පරීක්ෂකවරයා වෙත ඉදිරිපත් කිරීමෙන් සහ මෙහි දෙවන උපලේඛනයේ (ආ) ලැයිස්තුවේ දක්වා ඇති අදළ ගාස්තු ගෙවීමෙන් ද ලියාපදිංචි කිරීම, එසේ අලුත් කරවා ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය.

9. 8 වන නියෝගය යටතේ ලියාපදිංචි කිරීමේ සහතිකයක් අලුත් කිරීම සඳහා ඉල්ලුම් පත්‍රයක් ලැබුණ විට, ලියා පදිංචි කිරීම අලුත් කිරීම සඳහා ඉල්ලුම් පත්‍රයක් එවන ලද්දේ යම් බෝට්ටුවක් සම්බන්ධයෙන්ද, ඒ බෝට්ටු ව ධීවර අධ්‍යක්ෂවරයා විසින් හෝ ඔහු විසින් ඒ සඳහා බලය දෙන ලද යම් නිලධරයකු විසින් පරීක්ෂා කිරීමෙන් පසුව, ලියා පදිංචි කිරීමේ සහතිකයේ අවශ්‍ය සටහන් ඇතුළත් කොට ඒ සහතිකය ඉල්ලුම්කරු වෙත ආපසු යැවිය යුතුය.

10. (1) යම් ධීවර බෝට්ටුවක් පැවරීමේදී, පැවැරුම්කරු විසින්, මෙහි පළමුවන උපලේඛනයේ සඳහන් කොට ඇති 'ධීවර 56' ආකෘතිය සම්පූර්ණ කොට ප්‍රදේශයේ ධීවර පරීක්ෂකවරයා වෙත භාරදිය යුතුය. පැවරුම් ලාභියා විසින් දෙවන උපලේඛනයේ (ඇ) ලැයිස්තුවේ දක්වා ඇති ගාස්තුව ගෙවීමෙන් පසුව, පැවරුම්කරුගෙන් ලබාගත් ලියාපදිංචි කිරීමේ සහතිකයද සමඟ මෙහි පළමුවන උපලේඛනයේ සඳහන් කොට ඇති 'ධීවර 52' ආකෘතිය සම්පූර්ණ කොට භාර දිය යුතුය.

(2) (1) වන ඡේදයේ දක්වෙන ආකෘතීන් ලැබුණු විට, ධීවර අධ්‍යක්ෂ වරයා විසින් හෝ ඔහු විසින් බලය දෙන ලද යම් නිලධරයකු විසින්, එහි සඳහන් කරුණු යථා පරිදි සලකා බැලී මෙන් පසුව, නව අයිතිකරු වශයෙන් පැවැරුම්ලාභියාගේ නමින් බෝට්ටුව ලියාපදිංචි කළ යුතු අතර ඒ පැවැරුම් ලාභියා වෙත ලියාපදිංචි කිරීමේ සහතිකය භාර දිය යුතුය.

11. යම් ධීවර බෝට්ටුවක් ලියාපදිංචි කිරීමෙන් පසුව ඒ බෝට්ටුව සඳහා ඇන්ජිමක් ලබාගෙන තිබේ නම්, ඒ බෝට්ටුව නැවත ලියාපදිංචි කළ යුතුය. ධීවර අමාත්‍යාංශයේ අනුමතිය ඇතිව ඇන්ජිමක් ලබාගත් අවස්ථාවක, එවැනි බෝට්ටුවක් සම්බන්ධයෙන් වූ ලියාපදිංචි කිරීමේ සහතිකය ධීවර අධ්‍යක්ෂවරයා වෙත භාර දිය යුතුය. එවැනි එන්ජිමක් බෝට්ටුවට සවි කිරීමෙන් පසුව, මෙහි පළමුවන උපලේඛනයේ සඳහන් කොට ඇති ''ධීවර ආකෘති 49අ'' මගින් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළ යුතුය. එවැනි කාර්යයක් සඳහා ඒ බෝට්ටුව සම්බන්ධයෙන් රු. 25 ක මුදලක් ගෙවිය යුතුය. ලියාපදිංචි කිරීමේ සහතිකයෙහි අවශ්‍ය පිටපත් ඇතුළත් කිරීමෙන් පසුව එය අයිතිකරු වෙත ආපසු යැවිය යුතුය.

12. (1) ලියාපදිංචි කරන ලද යම් ධීවර බෝට්ටුවක් මුහුදේ යාත්‍රා කිරීම සඳහා යෝග්‍ය නොවන තත්ත්වයක තිබේ නම්, ඒ බෝට්ටුවේ ලියාපදිංචි කිරීම අවලංගු කරනු පිණිස, මෙහි පළමුවන උපලේඛනයේ සඳහන් කොට ඇති පරිදි ''ධීවර 59'' ආකෘතිය මත ධීවර අධ්‍යක්ෂවරයා වෙත ඉල්ලුම් පත්‍රයක් යැවිය යුතුය. ඒ ඉල්ලුම් පත්‍රය, එම බෝට්ටුව සම්බන්ධයෙන් නිකුත් කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකයද සමඟ එවිය යුතුය. මේ කාර්යය සඳහා කිසිදු ගාස්තුවක් අය කරනු නොලැබේ.

(2) (1) වන ඡේදය යටතේ ඉල්ලුම් පත්‍රයක් ලැබුණු විට, ධීවර අධ්‍යක්ෂවරයා හෝ ඔහු විසින් බලය දෙන ලද යම් නිලධරයකු එවැනි බෝට්ටුවක් මුහුදේ යාත්‍රා කිරීම සඳහා යෝග්‍ය නොවන බවට සෑහීමට පත් වන්නේ නම්, එම අධ්‍යක්ෂවරයා විසින් හෝ නිලධරයා විසින් ඒ බෝට්ටුවේ ලියාපදිංචි කිරීම අවලංගු කරනු ලැබිය හැකිය.

13. (1) නිකුත් කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකය නැතිවී, ඉරී හෝ විකෘති වී තිබේ නම්, රුපියල් පහළොවක (රු. 15) මුදලක් සමඟ මෙහි පළමුවන උපලේඛනයේ සඳහන් කොට ඇති ''ධීවර 55'' ආකෘතිය සම්පූර්ණ කර ඉදිරිපත් කිරීමෙන් ඒ සහතිකයේ අනු පිටපතක් නිකුත් කිරීම සඳහා ධීවර අධ්‍යක්ෂවරයා වෙත හෝ ඔහු විසින් බලය දෙන ලද නිලධරයකු වෙත ඉල්ලුම් පත්‍රයක් යැවිය යුතුය.

(2) (1) වන ඡේදය යටතේ කෙරෙන ඉල්ලුම් පත්‍රයක් ලැබුණු විට, ධීවර අධ්‍යක්ෂවරයා හෝ ඔහු විසින් බලය දෙන ලද යම් නිලධරයකු විසින් ලියාපදිංචි කිරීමේ සහතිකයේ අනුපිටපතක් ඉල්ලුම්කරු වෙත නිකුත් කරනු ලැබිය හැකිය.

14. (1) යම් ධීවර බෝට්ටුවක අයිතිකරුගේ මරණය සිදුවූ අවස්ථාවක, මෙහි පළමුවන උපලේඛනයේ සඳහන් කොට ඇති ''ධීවර 53'' ආකෘතිය මගින් ධීවර අධ්‍යක්ෂවරයා වෙත ඉල්ලුම් පත්‍රයක් යැවිය යුතුය. මියගිය තැනැත්තා ජීවත් වූයේ යම් පරිපාලන දිස්ත්‍රික්කයකද, ඒ දිස්ත්‍රික්කයේ උප දිසාපති වරයා විසින් මියගිය තැනැත්තාගේ යැපෙන්නන් සම්බන්ධයෙන් දෙන ලද වාර්තාවක්ද, පවරනු ලැබීමට අදහස් කෙරෙන තැනැත්තා වෙත බෝට්ටුව පැවරීම සඳහා එවැනි වෙනත් යැපෙන්නන්ගේ කැමැත්ත දක්වෙන ප්‍රකාශයක්ද එවැනි ඉල්ලුම් පත්‍රයක් සමඟ එවිය යුතුය. යථා පරිදි සම්පූර්ණ කරන ලද ''ධීවර 57'' ආකෘතිය සහ මියගිය තැනැත්තා පිළිබඳ මරණ සහතිකයේ පිටපතක් ද ඒ ඉල්ලුම් පත්‍රය සමඟ එවිය යුතුය.

(2) (1) වන ඡේදය යටතේ කෙරෙන ඉල්ලුම් පත්‍රයක් ලැබුණු විට, ධීවර අධ්‍යක්ෂවරයා විසින් හෝ ඔහු විසින් බලය දෙන ලද යම් නිලධරයකු විසින් අවශ්‍ය සංශෝධන කිරීමෙන් පසුව, ලියා පදිංචි කිරීමේ සහතිකය ඉල්ලුම්කරු වෙත ආපසු එවිය යුතුය.

15. 1955 අප්‍රේල් 23 වන දින හා අංක 10,788 දරණ ගැසට් පත්‍රය මගින් සංශෝධිත පරිදි 1953 අගෝස්තු 7 වන දින හා අංක 10,560 දරණ ගැසට් පත්‍රයේ ප්‍රකාශිත නියෝග මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

16. මෙම නියෝගවල—

''යාන්ත්‍රික බෝට්ටුව'' යන්නෙන් යාන්ත්‍රිකව පැදවෙන බෝට්ටුවක් අදහස් වේ ;

'' ශ්‍රී ලංකා ජලතීරය'' යන්නට—

(අ) 1976 අංක 22 දරණ සමුද්‍රීය කලාප පනතේ අර්ථ නිරූපණය කර ඇති ශ්‍රී ලංකාවේ දේශීය සමුද්‍රය ; සහ

(ආ) සියලු පොදු වරායවල්, ගංගා, විල්, කලපු, මෝය, දිය පාරවල්, වැව්, ජලාශ, පොකුණු, ඇළවල් සහ වෙනත් සියලු රට මැද පොදු ජල ප්‍රදේශ

ඇතුළත්වේ.

ධීවර 49 (සංශෝධිත)

## පළමුවන උප ලේඛනය

### ධීවර බෝට්ටුවක් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් පත්‍රය

1. බෝට්ටුව අයිතිකරුගේ නම :————.

2. බෝට්ටුව අයිතිකරුගේ ලිපිනය :————.

3. ධීවර බෝට්ටුව පිළිබඳ විස්තර :————.

(අ) පාවිච්චි කරන ලද දැව/ද්‍රව්‍ය :—

(1) කඳ :————.
(2) පෝරුව :————.
(3) කොල්ලෑව :————.

(ආ) සාදන ලද දිනය :————.

(ඇ) බෝට්ටුවේ වර්ගය—(පාරු, වල්ලම් ඔරු, කට්ටමරම්, තෙප්පම්, පඩවු, පාදිල්, කුල්ල හෝ වෙනත් බෝට්ටු :————.

(ඈ) බෝට්ටුවේ දිග :————.

(ඉ) බෝට්ටුව පාවිච්චි කරනුයේ—

(1) ලියා පදිංචි හිමියාගේ පුද්ගලික ප්‍රයෝජනයටද : ————.

(2) කුලියට දීමටද :————.

(ඊ) යාත්‍රාංගන අංකය :————.

(උ) යාන්ත්‍රික නම්—

(i) ඇන්ජිමේ වර්ගය :————.

(ii) අංකය හා අශ්ව බලය :————.

(ඌ) යාත්‍රාකරුවන්ගේ ගණන :————.

4. (අ) බෝට්ටුව රක්ෂණය කර තිබේ නම් :————.

(ආ) රක්ෂණ ඔප්පු අංකය :————.

(ඇ) රක්ෂණය කළ දිනය :————.

5. බෝට්ටුව නවත්වා තබන ස්ථානය—

(i) වරායේ හෝ ගමේ නම :————.

(ii) පාඩුවක් නම් බලපත්‍රය දරන්නාගේ නම සහ බලපත්‍රයේ අංකය : ————.

6. ලියාපදිංචි කිරීමේ සහතිකය එවිය යුතු ලිපිනය :————.

7. ඉහත විස්තර කරන ලද බෝට්ටුව මීට පෙර ලියාපදිංචි නොකරන ලද බවත්, ඉහත සඳහන් විස්තර සෑම අයුරින්ම සත්‍ය හා නිවැරදි බවත්, බෝට්ටුව නියම අයිතිකරු මා/අයිතිකරුවන් අප බවත් මෙයින් සහතික කරමි/කරමු.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

සාක්ෂිකරුගේ නම :..............................

සාක්ෂිකරුගේ අත්සන :..............................

දිනය :..............................

(බෝට්ටුව සඳහා අයිතිකරුවන් කීප දෙනෙකු සිටිනම්, ඔවුන්ගේ නම් හා ලිපිනයන් ද සැපයිය යුතුවේ. ඔවුන් සෑම දෙනාම මෙම ආකෘති පත්‍රයෙහි අත්සන් තැබිය යුතුය)

දිස්ත්‍රික් ධීවර ව්‍යාප්ති නිලධාරී,

.............................. (කොට්ඨාශය),

පසු පිටේ සඳහන් අයදුම් පත සම්බන්ධවයි.

පසුපිටේ දක්වා ඇති ඉල්ලුම් පත්‍රය සම්බන්ධයෙන්—

1. ලියාපදිංචි කිරීමේ ගාස්තු වශයෙන් රු. ............... ක මුදලක් ලැබුණු බවත්, අංක.....................හා................. වන දින දරණ කුවිතාන්සිය නිකුත්කළ බවත්,

2. අංක ........... දරණ රක්ෂණ සහතිකය පරීක්ෂා කර බැලූ බවත්,

3. 19...................... වන දින ම විසින් කරන ලද පරීක්ෂණයේදී ඉහත සඳහන් බෝට්ටුව සෑම ආකාරයකින්ම පරිපූර්ණව තිබූ බව මට පෙනී ගිය බවත් එය මුහුදේ යාත්‍රා කිරීම සඳහා යෝග්‍ය තත්ත්වයක තිබෙන බව පෙනී ගිය බවත් (මුහුදු ගමන් යෝග්‍යතා සහතිකය මීට අමුණා ඇත.)

4. පසු පිටේ 3 (9) සඳහන් බෝට්ටුව ........... ක අශ්ව බලයකින් හා ................................ වර්ගයෙන් හා අංකයෙන් යුක්ත බවත්,

5. පසු පිටේ දක්වා ඇති සියලු විස්තර මගේ දැනීමේ හැටියට නිවැරදි බවත්, මෙයින් සහතික කරමි.

.......................................
උප ධීවර පරීක්ෂක/ධීවර පරීක්ෂක.

දිනය : ...........................

මගේ අංකය :
දි.ධී.ව්‍යා.නි. කාර්යාලය,
............................ කොට්ඨාශය.

ධීවර ලේකම්,

ඉහත සඳහන් කුවිතාන්සිය සහ මුහුදු ගමන් යෝග්‍යතා සහතිකය මේ සමග එවා ඇති අතර බෝට්ටුව ලියාපදිංචි කිරීම නිර්දේශ කරමි.

.......................................
දිස්ත්‍රික් ධීවර ව්‍යාප්ති නිලධාරී.

දිනය :.................................

ධීවර 56 (සංශෝධන)

### ධීවර බෝට්ටුවක් වෙනත් කැනැත්තකුට පැවරීමේ ප්‍රකාශය

I වන කොටස

ධීවර ලේකම්,

.................................... පදිංචි ...................................වන

මම .............................. වන දින ලියාපදිංචි අංක ...........

යාත්‍රාංගන අංක ................ හා අශ්ව බල ...........................
(ඇන්ජිමේ නිර්මාණය)

අංක ................ දරණ වර්ගයේ ඇන්ජිමකින් සමන්විත අඩි ...........

දිග ධීවර බෝට්ටුව ......................................................පදිංචි

.................................... මහතා/මහත්මිය/මෙනවිය වෙත පැවරූ බව මෙයින් දැන ගත යුතුයි. ඔහු/ඇය පැවරීම පිළිගත් බවට මෙහි පහතින් අත්සන් කර ඇත. ධීවර බෝට්ටුවක් ලියාපදිංචි කිරීම පිළිබඳ පොත හා රක්ෂණ සහතිකයද මේ සමඟ එවමි.

.......................................
පැවරුම්කරුගේ අත්සන.

දිනය :......................

සාක්ෂිකරුවෝ : 1. අත්සන් : ......................................
නම සහ ලිපිනය : ..............................
..............................

2. අත්සන : ......................................
නම සහ ලිපිනය : ..............................
..............................

මෙම බෝට්ටුව මා වෙත පවරන ලද බව පිළි ගනිමි.

.......................................
පැවරුම්ලාභියාගේ අත්සන.

දිනය : ..........................

(ප්‍රදේශය භාර පරීක්ෂකවරයා සහ පැවරුම් ලාභියා හඳුනන සාක්ෂිකරුවන් දෙදෙනකු ඉදිරියේ යථෝක්ත ප්‍රකාශය අත්සන් කළ යුතුය.)

II වන කොටස

මගේ අංකය : ..................................
.......................................... දින දීය.

දි.ධී.ව්‍යා.නි.,
................................ කොට්ඨාශය.

පසුපිටේ සඳහන් පැවරුම්කරු/කරුවන් මා ඉදිරියේදී අත්සන් තබන ලදී. පැවරුම්කරු/කරුවන් ධීවර දෙපාර්තමේන්තුවට ණය ගැති නොවේ/වේ. අංකය ........... දරණ ආම්පන්න කාඩ් පත අවලංගු කර මා ළඟ තබා ගත්තෙමි. පැවරීමේ ගාස්තු වශයෙන් අයකළ රු. ................. ක් සඳහා අංක ........... හා ........................... දින දරණ කුවිතාන්සිය නිකුත් කර ඇත. ධීවර බෝට්ටුවක් ලියාපදිංචි කිරීම පිළිබඳ පොත ද රක්ෂණ සහතිකයද පැවරීමේ ගාස්තු වෙනුවෙන් ලබාගත් අංක ................ දරණ මුදල් ඇණවුම් ද මේ සමඟ ඒවා ඇත. පැවරීම නිර්දේශ කරමි.

.......................................
ධීවර පරීක්ෂක.

.............................. කොට්ඨාශය

III වන කොටස

මගේ අංකය : .................
දි.ධී.ව්‍යා.නි. කාර්යාලය,
.......................................

ධීවර ලේකම්,

.................................. වන දින පවරන ලද ධීවර බෝට්ටුවේ විස්තර ................ දරණ ලියාපදිංචි අංකයට නිකුත් කර ඇති ධීවර බෝට්ටුවක් ලියාපදිංචි කිරීම පිළිබඳ පොතෙහි ඇතුළත් කළෙමි. මගේ පොතෙහි ද අවශ්‍ය සටහන් තබා ඇත. ඉහතින් දක්වා ඇති මුදල් ඇණවුම ද මේ සමඟ එවා ඇත.

.......................................
දි.ධී.ව්‍යා.නි.,
ධීවර ලේකම් වෙනුවට.

දිනය : ............................

ධීවර 52 (සංශෝධිත)

### පවරන ලද ධීවර බෝට්ටුවක් ලියාපදිංචි කිරීම පිළිබඳ සංශෝධිත ඉල්ලුම් පත්‍රය

ධීවර ලේකම්,

............ පදිංචි............ මයා/මිය/මෙනවිය ගෙන් පවරා ගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් ............ පදිංචි ............ වන මම/අපි ලියා පදිංචි අංක ............ දරණ ............ වර්ගයේ ඇන්ජිමකින් සමන්විත අඩි ............ ක් දිග ධීවර බෝට්ටුව මට/අපට අයිති බව ප්‍රකාශ කර සිටින අතර ම එහි අළුත් අයිතිකරු/කරුවන් වශයෙන් මා/අප ලියා පදිංචි කිරීම සඳහා මෙයින් ඉල්ලුම් කර සිටිමි/සිටිමු.

(i) මේ බෝට්ටුව රැකියාවට යොදනුයේ,
(අ) පුද්ගලික පාවිච්චියට :............
(ආ) කුලියට දීමට :............

(ii) බෝට්ටුව සාමාන්‍යයෙන් නවතා තබන ස්ථානය :............

(iii) මෙම බෝට්ටුව සම්බන්ධයෙන් පැවරුම්කරුට (මුල් අයිතිකරුට) නිකුත් කර තිබූ අංක :............ දරණ ධීවර බෝට්ටුවක් ලියාපදිංචි කිරීම පිළිබඳ පොත ද මේ සමඟ ඇත.

(iv) අයිතිය සතුවන දිනය :............

11. යම් ධීවර බෝට්ටුවක් ලියාපදිංචි කිරීමෙන් පසුව ඒ බෝට්ටුව සඳහා ඇන්ජිමක් ලබාගෙන තිබේ නම්, ඒ බෝට්ටුව නැවත ලියාපදිංචි කළ යුතුය. ධීවර අමාත්‍යාංශයේ අනුමතිය ඇතිව ඇන්ජිමක් ලබාගත් අවස්ථාවක, එවැනි බෝට්ටුවක් සම්බන්ධයෙන් වූ ලියාපදිංචි කිරීමේ සහතිකය ධීවර අධ්‍යක්ෂවරයා වෙත භාර දිය යුතුය. එවැනි එන්ජිමක් බෝට්ටුවට සවි කිරීමෙන් පසුව, මෙහි පළමුවන උපලේඛනයේ සඳහන් කොට ඇති "ධීවර ආකෘති 49අ" මගින් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළ යුතුය. එවැනි කාර්යයක් සඳහා ඒ බෝට්ටුව සම්බන්ධයෙන් රු. 25 ක මුදලක් ගෙවිය යුතුය. ලියාපදිංචි කිරීමේ සහතිකයෙහි අවශ්‍ය පිටපත් ඇතුළත් කිරීමෙන් පසුව එය අයිතිකරු වෙත ආපසු යැවිය යුතුය.

12. (1) ලියාපදිංචි කරන ලද යම් ධීවර බෝට්ටුවක් මුහුදේ යාත්‍රා කිරීම සඳහා යෝග්‍ය නොවන තත්ත්වයක තිබේ නම්, ඒ බෝට්ටුවේ ලියාපදිංචි කිරීම අවලංගු කරනු පිණිස, මෙහි පළමුවන උපලේඛනයේ සඳහන් කොට ඇති පරිදි "ධීවර 59" ආකෘතිය මත ධීවර අධ්‍යක්ෂවරයා වෙත ඉල්ලුම් පත්‍රයක් යැවිය යුතුය. ඒ ඉල්ලුම් පත්‍රය, එම බෝට්ටුව සම්බන්ධයෙන් නිකුත් කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකයද සමඟ එවිය යුතුය. මේ කාර්යය සඳහා කිසිදු ගාස්තුවක් අය කරනු නොලැබේ.

(2) (1) වන ඡේදය යටතේ ඉල්ලුම් පත්‍රයක් ලැබුණු විට, ධීවර අධ්‍යක්ෂවරයා හෝ ඔහු විසින් බලය දෙන ලද යම් නිලධරයකු එවැනි බෝට්ටුවක් මුහුදේ යාත්‍රා කිරීම සඳහා යෝග්‍ය නොවන බවට සෑහීමට පත් වන්නේ නම්, එම අධ්‍යක්ෂවරයා විසින් හෝ නිලධරයා විසින් ඒ බෝට්ටුවේ ලියාපදිංචි කිරීම අවලංගු කරනු ලැබිය හැකිය.

13. (1) නිකුත් කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකය නැතිවී, ඉරී හෝ විකෘති වී තිබේ නම්, රුපියල් පහලොවක (රු. 15) මුදලක් සමඟ මෙහි පළමුවන උපලේඛනයේ සඳහන් කොට ඇති "ධීවර 55" ආකෘතිය සම්පූර්ණ කර ඉදිරිපත් කිරීමෙන් ඒ සහතිකයේ අනු පිටපතක් නිකුත් කිරීම සඳහා ධීවර අධ්‍යක්ෂවරයා වෙත හෝ ඔහු විසින් බලය දෙන ලද නිලධරයකු වෙත ඉල්ලුම් පත්‍රයක් යැවිය යුතුය.

(2) (1) වන ඡේදය යටතේ කෙරෙන ඉල්ලුම් පත්‍රයක් ලැබුණු විට, ධීවර අධ්‍යක්ෂවරයා හෝ ඔහු විසින් බලය දෙන ලද යම් නිලධරයකු විසින් ලියාපදිංචි කිරීමේ සහතිකයේ අනුපිටපතක් ඉල්ලුම්කරු වෙත නිකුත් කරනු ලැබිය හැකිය.

14. (1) යම් ධීවර බෝට්ටුවක අයිතිකරුගේ මරණය සිදුවූ අවස්ථාවක, මෙහි පළමුවන උපලේඛනයේ සඳහන් කොට ඇති "ධීවර 53" ආකෘතිය මගින් ධීවර අධ්‍යක්ෂවරයා වෙත ඉල්ලුම් පත්‍රයක් යැවිය යුතුය. මියගිය තැනැත්තා ජීවත් වූයේ යම් පරිපාලන දිස්ත්‍රික්කයකද, ඒ දිස්ත්‍රික්කයේ උප දිසාපති වරයා විසින් මියගිය තැනැත්තාගේ යැපෙන්නන් සම්බන්ධයෙන් දෙන ලද වාර්තාවක්ද, පවරනු ලැබීමට අදහස් කෙරෙන තැනැත්තා වෙත බෝට්ටුව පැවරීම සඳහා එවැනි වෙනත් යැපෙන්නන්ගේ කැමැත්ත දැක්වෙන ප්‍රකාශයක්ද එවැනි ඉල්ලුම් පත්‍රයක් සමඟ එවිය යුතුය. යථා පරිදි සම්පූර්ණ කරන ලද "ධීවර 57" ආකෘතිය සහ මියගිය තැනැත්තා පිළිබඳ මරණ සහතිකයේ පිටපතක් ද ඒ ඉල්ලුම් පත්‍රය සමඟ එවිය යුතුය.

(2) (1) වන ඡේදය යටතේ කෙරෙන ඉල්ලුම් පත්‍රයක් ලැබුණු විට, ධීවර අධ්‍යක්ෂවරයා විසින් හෝ ඔහු විසින් බලය දෙන ලද යම් නිලධරයකු විසින් අවශ්‍ය සංශෝධන කිරීමෙන් පසුව, ලියා පදිංචි කිරීමේ සහතිකය ඉල්ලුම්කරු වෙත ආපසු එවිය යුතුය.

15. 1955 අප්‍රේල් 23 වන දින හා අංක 10,788 දරණ ගැසට් පත්‍රය මගින් සංශෝධිත පරිදි 1953 අගෝස්තු 7 වන දින හා අංක 10,560 දරණ ගැසට් පත්‍රයේ ප්‍රකාශිත නියෝග මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

16. මෙම නියෝගවල—

"යාන්ත්‍රික බෝට්ටුව" යන්නෙන් යාන්ත්‍රිකව පැදවෙන බෝට්ටුවක් අදහස් වේ ;

"ශ්‍රී ලංකා ජලකීරය" යන්නට—

(අ) 1976 අංක 22 දරණ සමුද්‍රිය කලාප පනතේ අර්ථ නිරූපණය කර ඇති ශ්‍රී ලංකාවේ දේශීය සමුද්‍රය ; සහ

(ආ) සියලු පොදු වරායවල්, ගංගා, විල්, කලපු, මෝය, දිය පාරවල්, වැව්, ජලාශ, පොකුණු, ඇලවල් සහ වෙනත් සියලු රට මැද පොදු ජල ප්‍රදේශ

ඇතුළත්වේ.

ධීවර 49 (සංශෝධිත)

## පළමුවන උප ලේඛනය

### ධීවර බෝට්ටුවක් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් පත්‍රය

1. බෝට්ටුව අයිතිකරුගේ නම :————.

2. බෝට්ටුව අයිතිකරුගේ ලිපිනය :————.

3. ධීවර බෝට්ටුව පිළිබඳ විස්තර :————.

(අ) පාවිච්චි කරන ලද දැව/ද්‍රව්‍ය :—

(1) කඳ :————.
(2) පෝරුව :————.
(3) කොල්ලෑව :————.

(ආ) සාදන ලද දිනය :————.

(ඇ) බෝට්ටුවේ වර්ගය—(පාරු, වල්ලම් ඔරු, කට්ටමරම්, තෙප්පම්, පඩවු, පාදිල්, කුල්ල හෝ වෙනත් බෝට්ටු :————.

(ඈ) බෝට්ටුවේ දිග :————.

(ඉ) බෝට්ටුව පාවිච්චි කරනුයේ—

(1) ලියා පදිංචි හිමියාගේ පුද්ගලික ප්‍රයෝජනයටද : ————.

(2) කුලියට දීමටද :————.

(ඊ) යාත්‍රාංගන අංකය :————.

(උ) යාන්ත්‍රික නම්—

(i) ඇන්ජිමේ වර්ගය :————.

(ii) අංකය හා අශ්ව බලය :————.

(ඌ) යාත්‍රාකරුවන්ගේ ගණන :————.

4. (අ) බෝට්ටුව රක්ෂණය කර තිබේ නම් :————.

(ආ) රක්ෂණ ඔප්පු අංකය :————.

(ඇ) රක්ෂණය කළ දිනය :————.

5. බෝට්ටුව නවත්වා තබන ස්ථානය—

(i) වරායේ හෝ ගමේ නම :————.

(ii) පාඩුවක් නම් බලපත්‍රය දරන්නාගේ නම සහ බලපත්‍රයේ අංකය : ————.

6. ලියාපදිංචි කිරීමේ සහතිකය එවිය යුතු ලිපිනය :————.

7. ඉහත විස්තර කරන ලද බෝට්ටුව මීට පෙර ලියාපදිංචි නොකරන ලද බවත්, ඉහත සඳහන් විස්තර සෑම අයුරින්ම සත්‍ය හා නිවැරදි බවත්, බෝට්ටුව නියම අයිතිකරු මා/අයිතිකරුවන් අප බවත් මෙයින් සහතික කරමි/කරමු.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

සාක්ෂිකරුගේ නම :..........................................

සාක්ෂිකරුගේ අත්සන :..........................................

දිනය :..............................

(බෝට්ටුව සඳහා අයිතිකරුවන් කීප දෙනෙකු සිටීනම්, ඔවුන්ගේ නම් හා ලිපිනයන් ද සැපයිය යුතුවේ. ඔවුන් සෑම දෙනාම මෙම ආකෘති පත්‍රයෙහි අත්සන් තැබිය යුතුය)

දිස්ත්‍රික් ධීවර ව්‍යාප්ති නිලධාරි,

.............................. (කොට්ඨාශය),

පසු පිටේ සඳහන් අයදුම් පත සම්බන්ධවයි.

පසුපිටේ දක්වා ඇති ඉල්ලුම් පත්‍රය සම්බන්ධයෙන්—

1. ලියාපදිංචි කිරීමේ ගාස්තු වශයෙන් රු. ............... ක මුදලක් ලැබුණු බවත්, අංක.....................හා.................. වන දින දරණ කුවිතාන්සිය නිකුත්කළ බවත්,

2. අංක ........... දරණ රක්ෂණ සහතිකය පරීක්ෂා කර බැලූ බවත්,

3. 19........................ වන දින ම විසින් කරන ලද පරීක්ෂණයේදී ඉහත සඳහන් බෝට්ටුව සෑම ආකාරයකින්ම පරිපූර්ණව තිබූ බව මට පෙනී ගිය බවත් එය මුහුදේ යාත්‍රා කිරීම සඳහා යෝග්‍ය තත්ත්වයක තිබෙන බව පෙනී ගිය බවත් (මුහුදු ගමන් යෝග්‍යතා සහතිකය මීට අමුණා ඇත.)

4. පසු පිටේ 3 (9) සඳහන් බෝට්ටුව ........... ක අශ්ව බලයකින් හා .................................... වර්ගයෙන් හා අංකයෙන් යුක්ත බවත්,

5. පසු පිටේ දක්වා ඇති සියලු විස්තර මගේ දැනීමේ හැටියට නිවැරදි බවත්, මෙයින් සහතික කරමි.

............................................
උප ධීවර පරීක්ෂක/ධීවර පරීක්ෂක.

දිනය : ............................

මගේ අංකය :
දි.ධී.ව්‍යා.නි. කාර්යාලය,
.............................. කොට්ඨාශය.

ධීවර ලේකම්,

ඉහත සඳහන් කුවිතාන්සිය සහ මුහුදු ගමන් යෝග්‍යතා සහතිකය මේ සමග එවා ඇති අතර බෝට්ටුව ලියාපදිංචි කිරීම නිර්දේශ කරමි.

............................................
දිස්ත්‍රික් ධීවර ව්‍යාප්ති නිලධාරී.

දිනය :..................................

ධීවර 56 (සංශෝධන)

ධීවර බෝට්ටුවක් වෙනත් තැනැත්තකුට පැවරීමේ ප්‍රකාශය

I වන කොටස

ධීවර ලේකම්,

.................................. පදිංචි ..............................වන
මම .................................. වන දින ලියාපදිංචි අංක ...........
යාත්‍රාංගන අංක ................. හා අශ්ව බල ............................
(ඇන්ජිමේ නිර්මාණය)
අංක ................. දරණ වර්ගයේ ඇන්ජිමකින් සමන්විත අඩි ............
දිග ධීවර බෝට්ටුව ...........................................................පදිංචි
.................................... මහතා/මහත්මිය/මෙනවිය වෙත පැවරූ බව මෙයින් දැන ගත යුතුයි. ඔහු/ඇය පැවරීම පිළිගත් බවට මෙහි පහතින් අත්සන් කර ඇත. ධීවර බෝට්ටුවක් ලියාපදිංචි කිරීම පිළිබඳ පොත හා රක්ෂණ සහතිකයද මේ සමග එවමි.

............................................
පැවරුම්කරුගේ අත්සන.

දිනය :.......................

සාක්ෂිකරුවෝ : 1. අත්සන් : ............................................
නම සහ ලිපිනය : ..........................................
..........................................

2. අත්සන : ............................................
නම සහ ලිපිනය : ..........................................
..........................................

මෙම බෝට්ටුව මා වෙත පවරන ලද බව පිළි ගනිමි.

............................................
පැවරුම්ලාභියාගේ අත්සන.

දිනය : ............................

(ප්‍රදේශය භාර පරීක්ෂකවරයා සහ පැවරුම් ලාභියා හඳුනන සාක්ෂිකරුවන් දෙදෙනකු ඉදිරියේ යථෝක්ත ප්‍රකාශය අත්සන් කළ යුතුය.)

II වන කොටස

මගේ අංකය : ..................................
.......................................... දින දීය.

දි.ධී.ව්‍යා.නි.,
................................ කොට්ඨාශය.

පසුපිටේ සඳහන් පැවරුම්කරු/කරුවන් මා ඉදිරියේදී අත්සන් තබන ලදී. පැවරුම්කරු/කරුවන් ධීවර දෙපාර්තමේන්තුවට ණය ගැති නොවේ/වේ. අංකය ........... දරණ ආම්පන්න කාඩ් පත අවලංගු කර මා ළඟ තබා ගත්තෙමි. පැවරීමේ ගාස්තු වශයෙන් අයකළ රු. ................. ක් සඳහා අංක ........... හා ............................ දින දරණ කුවිතාන්සිය නිකුත් කර ඇත. ධීවර බෝට්ටුවක් ලියාපදිංචි කිරීම පිළිබඳ පොත ද රක්ෂණ සහතිකයද පැවරීමේ ගාස්තු වෙනුවෙන් ලබාගත් අංක ................ දරණ මුදල් ඇණවුම් ද මේ සමග එවා ඇත. පැවරීම නිර්දේශ කරමි.

............................................
ධීවර පරීක්ෂක.

................................ කොට්ඨාශය

III වන කොටස

මගේ අංකය : .................
දි.ධී.ව්‍යා.නි. කාර්යාලය,
............................................

ධීවර ලේකම්,

.................................. වන දින පවරන ලද ධීවර බෝට්ටුවේ විස්තර ................. දරණ ලියාපදිංචි අංකයට නිකුත් කර ඇති ධීවර බෝට්ටුවක් ලියාපදිංචි කිරීම පිළිබඳ පොතෙහි ඇතුළත් කළෙමි. මගේ පොතෙහි ද අවශ්‍ය සටහන් තබා ඇත. ඉහතින් දක්වා ඇති මුදල් ඇණවුම ද මේ සමග එවා ඇත.

............................................
දි.ධී.ව්‍යා.නි.,
ධීවර ලේකම් වෙනුවට.

දිනය : ............................

ධීවර 52 (සංශෝධිත)

පවරන ලද ධීවර බෝට්ටුවක් ලියාපදිංචි කිරීම පිළිබඳ
සංශෝධිත ඉල්ලුම් පත්‍රය

ධීවර ලේකම්,

............ පදිංචි............ මයා/මිය/මෙනවිය ගෙන් පවරා ගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් ............ පදිංචි ............ වන මම/අපි ලියා පදිංචි අංක ............ දරණ ............ වර්ගයේ ඇන්ජිමකින් සමන්විත අඩි ............ ක් දිග ධීවර බෝට්ටුව මට/අපට අයිති බව ප්‍රකාශ කර සිටින අතර ම එහි අළුත් අයිතිකරු/කරුවන් වශයෙන් මා/අප ලියා පදිංචි කිරීම සඳහා මෙයින් ඉල්ලුම් කර සිටිමි/සිටිමු.

(i) මේ බෝට්ටුව රැකියාවට යොදනුයේ,
(අ) පුද්ගලික පාවිච්චියට :............
(ආ) කුලියට දීමට :...........

(ii) බෝට්ටුව සාමාන්‍යයෙන් නවතා තබන ස්ථානය : ............

(iii) මෙම බෝට්ටුව සම්බන්ධයෙන් පැවරුම්කරුට (මුල් අයිතිකරුට) නිකුත් කර තිබූ අංක :............ දරණ ධීවර බෝට්ටුවක් ලියාපදිංචි කිරීම පිළිබඳ පොත ද මේ සමඟ ඇත.

(iv) අයිතිය සතුවන දිනය :............

ඉහත සඳහන් විස්තර සර්වප්‍රකාරයෙන්ම සත්‍ය හා නිරවද්‍ය බව මෙයින් ප්‍රකාශ කරමි. ලියාපදිංචි කිරීමේ සහතිකය පහත සඳහන් ලිපිනයට එවන්න.

............,
............
............

————————,
නව අයිතිකරුගේ/කරුවන්ගේ අත්සන.

දිනය :............

දි. ධී. ව්‍යා. නි.

............ කොට්ඨාශය.

ධීවර ලේකම්,

අවශ්‍ය කටයුතු සඳහා ඉදිරිපත් කරණ ලදී.

............,
දි. ධී. ව්‍යා. නිලධාරී.
............ කොට්ඨාශය.

දිනය :............

ධීවර 49ඒ (සංශෝධිත)

**නව ඇංජිමක් සහිත බෝට්ටුවක් නැවත ලියා පදිංචි කිරීමේ සංශෝධිත ඉල්ලුම් පත්‍රය**

1. අයිතිකරුගේ නම :————.
2. අයිතිකරුගේ ලිපිනය :————.
3. ධීවර බෝට්ටුව පිළිබඳ විස්තර :—
   (අ) ලියාපදිංචි අංකය :————.
   (ආ) ලියාපදිංචි කළ දිනය :————.
   (ඇ) පාවිච්චි කරන ලද දව/ද්‍රව්‍ය :————.
      (i) කඳ :————.
      (ii) පෝරුව :————.
      (iii) කොල්ලෑව :————.
   (ඈ) සාදන ලද දිනය :————.
   (ඉ) බෝට්ටුවේ වර්ගය (ඔරුව, තෙප්පම, ෆයිබර් ග්ලාස් බෝට්ටුව ආදි වශයෙන් :————.
   (ඊ) බෝට්ටුවේ දිග සහ පළල :————.
4. නව ඇංජිම පිළිබඳ විස්තර :————.
   (i) අංකය :————.
   (ii) වර්ගය :————.
   (iii) අශ්වබලය :————.
   (iv) භාවිතා කරන ඉන්ධන වර්ගය :————.
   (v) මිලට ගත් දිනය :————.
5. බෝට්ටුව නවතා තබන ස්ථානය :————.

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

**II වන කොටස**

දි.ධී.ව්‍යා.නි.

..............................

ඉහත සඳහන් බෝට්ටුව සඳහා නිකුත් කරන ලද ඇංජිමේ අංකය හා වර්ගය පරීක්ෂා කළ බවත්, ඉල්ලුම් පතෙහි සඳහන් බෝට්ටුවට එම ඇංජිම සවිකර ඇති බවත්, ලියාපදිංචි කිරීමේ ගාස්තු වශයෙන් රු. 25 ක් අංක :............... ..............................දින දරණ කුවිතාන්සියෙන් ධීවර අමාත්‍යාංශයට ගෙවා ඇති බවත් සහතික කරමි.

..............................
ධීවර පරීක්ෂක.

දිනය :.................

..............................
ධීවර පරීක්ෂක කොට්ඨාශය.

**III වන කොටස**

ධීවර ලේකම්,

අවශ්‍ය කටයුතු සඳහා ඉදිරිපත් කරන ලදී.

..............................
දිස්ත්‍රික් ධීවර ව්‍යාප්ති නිලධාරී.

දිනය :..............................

..............................
කොට්ඨාශය.

**IV වන කොටස**

.............................................. වන දින නැවත ලියාපදිංචි කරන ලදී.

..............................
ධීවර ලේකම් වෙනුවට.

දිනය :.......................

මුල්පිටපත
පොදු 172

අංකය :————
දිනය :————

මුදල් කුවිතාන්සිය

ලැබුනේ ————. ගෙනි.

ලැබුණු මුදල රු. ————. හා ශත ————.

කාරණය ————.

රු. ————.

————.
අත්සන හා පදවි නාමය.

දෙවන උපලේඛනය

**"අ" දරන ලැයිස්තුව**

ප්‍රථම වරට ධීවර බෝට්ටුවක් ලියාපදිංචි කිරීමේ දී අය කළ යුතු ගාස්තු—

| | | රු. | ශ. |
|---|---|---|---|
| 1. | අඩි 32ට වැඩි සියළුම යාන්ත්‍රික බෝට්ටු සඳහා ... | 100 | 0 |
| 2. | ඇතුළත සවිකළ ඇංජින් සහිත අඩි 32 දක්වා දිග බෝට්ටු සඳහා ... ... ... | 50 | 0 |
| 3. | පිටත සවිකළ ඇංජින් සහිත යාන්ත්‍රික බෝට්ටු සඳහා ... | 25 | 0 |
| 4. | යාන්ත්‍රික නොවන බෝට්ටු සඳහා ... ... | 5 | 0 |

**"ආ" දරන ලැයිස්තුව**

ධීවර බෝට්ටු ලියාපදිංචිය අළුත් කිරීම සඳහා අය කළ යුතු ගාස්තු—

| | | | |
|---|---|---|---|
| 1. | අඩි 32ට වැඩි සියලුම බෝට්ටු සඳහා ... ... | 25 | 0 |
| 2. | ඇතුළත සවිකළ ඇංජින් සහිත අඩි 32 දක්වා දිග බෝට්ටු සඳහා ... ... ... | 15 | 0 |
| 3. | පිටත සවිකළ ඇංජින් සහිත යාන්ත්‍රික බෝට්ටු සඳහා | 10 | 0 |
| 4. | යාන්ත්‍රික නොවන බෝට්ටු සඳහා ... ... | 2 | 50 |

**"ඇ" දරන ලැයිස්තුව**

ධීවර බෝට්ටු පැවරීම සඳහා අයකළ යුතු ගාස්තු—

| | | | |
|---|---|---|---|
| 1. | අඩි 32ට වැඩි සියළුම බෝට්ටු සඳහා ... ... | 25 | 0 |
| 2. | ඇතුළත සවිකළ ඇංජින් සහිත අඩි 32 දක්වා දිග බෝට්ටු සඳහා ... ... | 15 | 0 |
| 3. | පිටත සවිකළ ඇංජින් සහිත යාන්ත්‍රික බෝට්ටු සඳහා ... | 10 | 0 |
| 4. | යාන්ත්‍රික නොවන බෝට්ටු සඳහා ... ... | 2 | 50 |

ධීවර 53
Fisheries 53
(F 2* S. T. & E.) 3/60

ඇෆ් ආකෘති පත්‍රය
FORM F

(12 වැනි නියෝගය)
Regulation 12

ලියාපදිංචි අයිතිකරුගේ මරණින් පසු ධීවර යාත්‍රාවක් ලියාපදිංචි කිරීමේ ඉල්ලුම් පත්‍රය

Application for Registration of Fishing Boat on the Death of Registered Owner

කොළඹ, ධීවර අධ්‍යක්ෂ වෙත.
*To:* Director of Fisheries,
Colombo.

අංක .......................... දරණ ධීවර යාත්‍රාවේ ලියාපදිංචි අයිතිකරු 19 .............. මස ......... වැනි දින මරණයට පත්වූයෙන්[2] ................. ............................................ පදිංචි[1] ............................................ වන මම මියගිය අයගේ[1] ............................................ වශයෙන් යාත්‍රාවේ අයිතිකරු ලෙස ලියාපදිංචිවීම සඳහා මෙයින් ඉල්ලුම් කරමි.

Consequent on the death on the..........day of...... ....19 of the registered owner of fishing boat No.......I[1].... ....................of[2]..........................as the[3] ..........................of the deceased, hereby apply to be registered as the owner of that boat.

(1) යාත්‍රාව කුමන කාර්යයක් සඳහා පාවිච්චි කරනු ලබන්නේද යන වග: ......... ....................................................................
Purpose for which the boat will be used.

(2) යාත්‍රාව සාමාන්‍යයෙන් නවතා තබන ස්ථානයේ ලිපිනය :
Address at which the boat will be usually kept.

එම යාත්‍රාවට අදාල ලියාපදිංචි කිරීමේ සහතිකය මේ සමඟ ඉදිරිපත් කරමි.
I enclose the certificate of registration relating to that boat.

ලියාපදිංචි කිරීමේ සහතිකය පහත දක්වෙන ලිපිනයට මා වෙත එවන්න
The certificate of registration should be sent to me to the following address :—

....................................................................................
....................................................................................

ධීවර 55
Fisheries 55

ලියාපදිංචි කිරීමේ සහතිකයෙහි අනුපිටපතක් ලබාගැනීමේ ඉල්ලුම් පත්‍රය

APPLICATION FOR A DUPLICATE CERTIFICATE OF REGISTRATION

කොළඹ 3, ධීවර අධ්‍යක්ෂ වෙතයැ.
*To :* The Director of Fisheries,
Colombo 3.

.............................................................................. පදිංචි[2]
[1] ,........................................................
.................. .............................. වර්ගයේ අංක ..................
of[2]..........................the holder of
දරණ ධීවර යාත්‍රාවේ ලියාපදිංචි සහතිකය හිමි ..............................
certificate of registration of boat No.......type........hereby declare that the said certificate of registration has been
........................................ වන මම පහත සඳහන් කරුණු නිසා
(සත්‍ය කරුණු ප්‍රකාශ කළ යුතුයි) එම ලියා පදිංචිකිරීමේ සහතිකය නැතිවූ/විනාශවූ/ඉරුණු[3] බව මෙයින් ප්‍රකාශ කරමි.

lost/destroyed/damaged3 in the following circumstances (state facts)..........................................
....................................................................................
....................................................................................
....................................................................................

මැකීගිය/ඉරුණු ලියා පදිංචිකිරීමේ සහතිකය මේ සමඟ එවමි.

I am enclosing herewith the defaced/damaged[3] certificate of registration.

නැතිවී යයි හෝ විනාශ වී ඇතැයි සටහන් කළ ලියා පදිංචි කිරීමේ සහතිකය සොයා ගැනීමට හැකිවුවහොත් හෝ එහි කවර කොටසක් හෝ මින්පසු ලැබුණොත්, එය ඔබ වෙත ඉදිරිපත් කිරීමට මම පොරොන්දු වෙමි.

If the certificate of registration which is reported to have been lost or destroyed is found, or any part of it is hereafter recovered, I undertake to forward the same to you.

ඉහත සඳහන් ප්‍රකාශයන් සෑම අයුරින්ම සත්‍ය බවට මෙයින් සහතික කරමින් ලියා පදිංචි කිරීමේ සහතිකයෙහි අනුපිටපතක් ඉල්ලා සිටිමි.

and I hereby declare that the above statements are true and accurate in every respect, and apply for a duplicate certificate of registration.

2(ආ) ව්‍යවස්ථාව ප්‍රකාර ලියා පදිංචි කිරීමේ සහතිකයෙහි අනුපිටපතක් ලබාගැනීමේ ගාස්තුව වශයෙන් රු. ........................ට මුදල් ඇණවුමක්/තැපැල් ඇණවුමක් මේ සමඟ එවමි.

A Money Order/Postal Order for Rs.......being fee for duplihate certificate of registration in terms of regulation 2(*b*) is sent cerewith.

..............................
හිමිකාරයාගේ අත්සන.
Signature of Owner.

දිනය
Date..................

ධීවර 57
Fisheries 57
(*46 S., T. F E.) 3/69

අයිතිකරුගේ මරණය දන්වීම
NOTICE OF DECEASED OWNER

ධීවර අධ්‍යක්ෂ/
කොළඹ 3/

*To :* The Director of Fisheries,
Colombo 3.

........................................................................ පදිංචි
........................................................................ වන මම[1]
.............................. අංකය සහ.............................. වර්ගයේ ධීවර
යාත්‍රාවේ ලියා පදිංචි හිමිකරු වන ................................................
[1]මැරුණ බව මෙයින් දැනුම් දෙමි. මැරුණ අය ..........................දින
........................................................................ හිදී මැරුණේය
........................................ [3]වන මම යාත්‍රාව භාරව සිටින අය වෙමි

I[1]...............................................of[2].. ....................................hereby give notice of the death of [1]...................... the registered owner of fishing boat No....... Type....... The deceased died on.... at.......... I as[3] ..............................am the person having the custody of the boat.

..............................
දැන්වූ අයගේ අත්සන
Signature of Informant.

දිනය :
Date } ................................

---

1. සම්පූර්ණ නම/Full name in capitals.
2. තැපැල් ලිපිනය/Postal address.
3. අනවශ්‍ය වචන කපා හරින්න/Strike out words not applicable.

---

1. සම්පූර්ණ නම. මහත්මයාද, මහත්මියද, මෙනවියද සඳහන් කරන්න
Full name in capitals. Also state whether Mr. Mrs. or Miss.
2. ලිපිනය :
Address
3. විධායකයාද, පාලකයාද, හිමිකරුද සහ සමාගමද, යන වග සඳහන් කරන්න.
State whether executor, administrator, heir, &c.

ධීවර 59
Fisheries 59

අංක .....................දරණ ධීවර යාත්‍රාවේ ලේඛණගතවීම අවලංගු කිරීමේ දැන්වීම

## NOTICE FOR CANCELLATION OF REGISTRATION OF FISHING BOAT No.

දැනට ....................................................................... පදිංචි ......................................................................... වන මම අංක .................................. දරණ ධීවර යාත්‍රාවේ ලේඛනගත අයිති වශයෙන්. එම යාත්‍රාවේ සදහටම ප්‍රයෝජනයට ගත නොහැකි බවත් මින් ඉදිරියට එය ප්‍රයෝජනයට ගැනීමට නුසුදුසු බවත් මෙයින් දැනුම් දෙමි. එම යාත්‍රාව ලේඛණගතවීම අවලංගු කරන මෙන් ඉල්ලා සිටිමි. ලේඛන ගත වීමේ සහතිකය මේ සමඟ එවා ඇත.

I,....................................... Presently of ........................ hereby declare that fishing boat .... of which I am the registered owner has become PERMANENTLY UNSERVICEABLE and is unfit for further use. I hereby apply for cancellation of its registration. The certificate of registration is enclosed.

පහත සඳහන් කරුණ මම ප්‍රකාශ කරමි.
I declare as follows. —

1. එම යාත්‍රාව අළුත් වැඩියා කළ හැකි ද ? නොහැකිද ?
   Whether repairable or not ?

2. එහි සියළුම කොටස් පරීක්ෂා කිරීම ට තිබේද ?
   Whether all parts are available for inspection ?

3. එහි ඉතිරිව ඇති කොටස් වලට කුමක් කිරීමට අදහස් කර තිබේ ?
   How it is proposed to dispose of the available parts ?

4. ධීවර අධ්‍යක්ෂක විසින් බලය දුන් නිලධාරියකුට එම යාත්‍රාවේ කොටස් පරීක්ෂා කළ හැකි ස්ථානයේ ලිපිනය :
   Address at which the parts of the boat can be inspeced by an officer authorised by the Director of Fisheries ;

5. යාත්‍රාව දැන් පවතින තත්ත්වයට වැටුනේ පහත සඳහන් කරුණු නිසාය
   The present condition of the boat is due to the following circumstances.

.................................
අත්සන
Signature.

දිනය
Date ———.

### නව ක්‍රමය යටතේ මිරිදිය ධීවර යාත්‍රා ලියාපදිංචි කිරීම

ධීවර යාත්‍රා ලියාපදිංචි කිරීමේ නව පණත යටතේ මිරිදිය ධීවර යාත්‍රා ලියාපදිංචි කිරීම සඳහා එක් එක් මිරිදිය ධීවර මධ්‍යස්ථානය සඳහා පහත සඳහන් පරිදි සංකේත අක්ෂර යොදනු ලැබේ :—

| | මධ්‍යස්ථානය | | සංකේත අක්ෂරය |
|---|---|---|---|
| 1. | අනුරාධපුරය | ... | අ. |
| 2. | බදුල්ල | ... | බ. |
| 3. | මොනරාගල | ... | මො. |
| 4. | රත්නපුරය | ... | ර. |
| 5. | පොලොන්නරුව | ... | පො. |
| 6. | මහනුවර | ... | ම. නු. |
| 7. | කෑගල්ල | ... | කෑ. |
| 8. | නුවරඑළිය | ... | නු. |
| 9. | කුරුණෑගල | ... | කු |
| 10. | මාතලේ | ... | මා. ලේ. |
| 11. | වවුනියාව | ... | ව. |

### REGISTRATION OF CODE FISHERIES CRAFTS UNDER THE NEW SCHEME

The following code letters are given for each Inland Fishery Station for the registration of Inland Fisheries Crafts under the new scheme of the Registration of fishing crafts :—

| | Station | | Code letter |
|---|---|---|---|
| 1. | Anuradhapura | ... | අ. |
| 2. | Badulla | ... | බ. |
| 3. | Moneragala | ... | මො. |
| 4. | Ratnapura | ... | ර. |
| 5. | Polonnaruwa | ... | පො. |
| 6. | Kandy | ... | ම.නු. |
| 7. | Kegalle | ... | කෑ. |
| 8. | Nuwara Eliya | ... | නු. |
| 9. | Kurunegala | ... | කු. |
| 10. | Matale | ... | මා.ලේ. |
| 11. | Vavuniya | ... | ව. |